**ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශය *සහ* වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.1.1, 3.1.2 හා 3.1.3 වගුවල ඇතුළත් ආදායම් සංකේතවලට අදාළ ආදායම් ගිණුම් 17 ක්ද, ශ්‍රී ලංකා රේගුව විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, ගණන්දීමේ නිලධාරීගේ හා ආදායම් ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රජයේ වියදම්, රජයේ ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ශ්‍රී ලංකා රේගුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරනු ලැබේ. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා රේගුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.20 ඡේදය දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී හා ආදායම් ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) - ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරී හා ආදායම් ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත නොවීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසාදීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත කළ යුතු කරුණු ඇතුළත් නොකිරීම | 2.1.1 |
| | | 2. කාර්යභාරයයන් ඉටු නොකිරීම | 2.1.2 |
| | | 3. තිරසර සංවර්ධනය | 2.2 |
| | | 4. පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය | 2.7 |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද, සම්පූර්ණයෙන්ම ද, අප්‍රමාදව ද, එකතු කර ගැනිමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයිම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා | 1. ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීමේ අඩුපාඩු | 2.3 |
| | | 2. කළමනාකරණ දුර්වලතා | 2.6 |
| | | 3. ටෙන්ඩර් තැන්පතු ශේෂය තහවුරු කර ගැනීමට නොහැකිවීම | 2.12(අ) |
| | | 4. ගුවන් මගින් රැගෙන එනු ලබන භාණ්ඩ සඳහා අයකරනු ලබන තැන්පතු සම්බන්ධයෙන් වූ අඩුපාඩු | 2.13 |

| | | | |
|---|---|---|---|
| | නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | 5. අත්අඩංගුවට ගන්නා ලද රාජසන්තක කරන ලද බඩු ද්‍රව්‍ය සඳහා ලබා දී තිබුණු අත්තිකාරම් නොපියවීම | 2.14 |
| | | 6. විගණන සාක්ෂි නොවීම | 2.18 |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | 1. අග්‍රිම ශේෂය පියවීමේ ප්‍රමාදය | 2.15 |
| | | 2. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම | 2.17 |
| | | 3. නීති, රීති හා රෙගාසිවලට අනුකූල නොවීම | 2.19.1 |
| | | 4. බදු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම | 2.19.2 |
| 128(1)(ඈ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව. | 1. අත්තිකාරම් ගිණුමේ ශේෂ නොසැසඳීම් | 2.9(අ) |
| | | 2. අග්‍රිම ගිණුමේ ශේෂය නොසැසඳීම | 2.10 |
| | | 3. පොදු තැන්පත් ශේෂ නොසැසඳීම | 2.11 |
| | | 4. බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු | 2.16 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව. | 1. වත්කම් ලේඛනගත කිරීමේ අඩුපාඩු | 2.4(අ) |
| | | 2. රජය සතු වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා නොකිරීම | 2.4(ආ) |
| | | 3. වත්කම් ආරක්ෂාව තහවුරු නොකිරීම | 2.4(ඇ) |
| | | 4. වාහන උපයෝජනය කිරීමේ අඩුපාඩු | 2.4(ඈ) |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනිමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබු පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාරතා කරන බව, | හිඟහිටි ණය ශේෂ අයකර නොගැනීම | 2.9(අ) |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව | මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.20 |
| 128(1)(ඒ) | දරන ලද කිසියම් වියදමක් හෝ වගකීමක් බැදීමක් වුවද, තම වැය විෂය පථය හෝ සීමාවන් හෝ වෙනත් බලය දෙනු ලැබූ මූල්‍ය ප්‍රතිපාදනයක ඇතුළත වැටෙන බවට හා එය ප්‍රමාණවත් තරම් අධිකාර බලයෙන් ආවරණය වන බව | සලසා තිබුණු ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැඳීම්වලට එළඹීම | 2.5 |

**මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාර රාජ්‍ය ආදායම් ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය**

---

| | | | |
|---|---|---|---|
| 128(2)(අ) | ආදායම් සංකේතයට අදාළ ආදායම් ඇස්තමේන්තු සම්පූර්ණ ලෙසත්, හැකිතාක් නිවැරදිවත් පිළියෙල කිරිම | ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර ප්‍රමාණාත්මක විචලතාවන් පැවැතීම | 2.8.1 |
| 128(2)(ඉ) | රාජ්‍ය ආදායම් එකතු කිරීම සම්බන්ධව කටයුතු කරන ගණන්දීමේ නිලධාරීන් සහ | 1. හිඟහිටි ආදායම්<br>2. ආදායම් අභිමිවිම<br>3. ආදායම් අත්හැරීම | 2.8.2<br>2.8.3<br>2.8.4 |

| | | | |
|---|---|---|---|
| දෙපාර්තමේන්තු විමසා, රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධව විශේෂ විධිවිධාන යොදන බව | 4. | ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය | 2.8.5 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 2.1 කාර්යසාධනය

----------------

#### 2.1.1 සැලැසුම් කිරිම

----------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ පහත සඳහන් කරුණු අන්තර්ගත යුතු වුවත්, ශ්‍රී ලංකා රේගුව විසින් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ එම කරුණු ඇතුළත් කර නොතිබුණි.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර

(ආ) වාර්ෂික අයවැය ඇස්තමේන්තු පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan), ක්‍රියාත්මක කළ කාල රාමුව (Time Line) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල (Output/ Outcome

(ඇ) ආදායම් එකතු කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම

(ඈ) අක්මුදල් අවශ්‍යතා සැලැස්ම (Imprest Requirement Plan)

(ඉ) වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම (Annual Procurement Plan)

(ඊ) අභ්‍යන්තර විගණන සැලැස්ම (Internal Audit Plan)

#### 2.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

--------------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ශ්‍රී ලංකා රේගුවේ සැපයුම් අංශය විසින් ප්‍රධාන කාර්යයන් 37 ක් ඉටු කළ යුතුව තිබුණි. එම කාර්යයන් අතරින් එකතුව රු.මිලියන 35 ක ප්‍රතිපාදන සලසා තිබුණු කාර්යභාරයන් 05 ක් ඉටු කර නොතිබුණි. එම කාර්ය භාරයයන් ඉටු නොකිරිම නිසා පහත සඳහන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(අ) ක්‍රියාකාරී සැලැස්ම අනුව රසායනාගාර උපකරණ ලබා ගැනිම සඳහා රු.මිලියන 10 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, එම ප්‍රතිපාදන උපයෝජනය නොකිරිම නිසා වැඩි ගුණත්වයකින් යුතුව පරීක්ෂණ ප්‍රතිඵල අත්කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මට අනුව සේවා සැපයුම් අංශය, ගබඩා සංකීර්ණය, දිගු කාමරය හා වාහන අංගනය තුළ ක්ෂණික දසුන් ලබා ගැනීමේ පද්ධතිය (CCTV) ඉදිකිරීම සඳහා රු.මිලියනයක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදන උපයෝජනය කර අදාළ කාර්යය ඉටු නොකිරිම නිසා එම අංශවල සිදුවිය හැකි නීති විරෝධී ක්‍රියා සුපරීක්ෂණ අවස්ථාව අහිමිවීම නිසා අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීමට නොහැකි වී තිබුණි.

**2.2** **තිරසර සංවර්ධනය**

**----------------------**

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව වූ තිරසර සංවර්ධන අරමුණු ශ්‍රී ලංකා රේගුවේ කාර්ය භාරයන් හා අනුගත නොවන බව දක්වා ශ්‍රී ලංකා රේගුව විසින් තිරසර සංවර්ධන අරමුණු කෙරෙහි අවධානය යොමු කර තිබුණි.

**2.3** **ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම**

**------------------------------------------------------------------**

ශ්‍රී ලංකා රේගුව සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 286.98 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 260.9 ප්‍රතිපාදන වාහන මිලදී ගැනීම සඳහා සලසා තිබුණු අතර එම ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි. ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රු.මිලියන 8.87 ක සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 8.87 ක් ඇතුළුව රු.මිලියන 270.94 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1(අ)(ii) හා (iv) වගන්ති ප්‍රකාරව තාක්ෂණික ඇගැයීම් කමිටුව විසින් භාණ්ඩවලට අදාළ පිරිවිතර සමාලෝචනය කිරීම හා ලංසු කැඳවීමේ ලේඛන සමාලෝචනය කර අනුමත කළ යුතුව තිබුණත්, රු.මිලියන 3.01 ක් වටිනා පොලිසැග් මළු මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේදී තාක්ෂණ ඇගැයීම් කමිටුව විසින් අදාළ පිරිවිතර හා ලංසු කැඳවීමේ ලේඛන තාක්ෂණ ඇගැයීම් කමිටුව විසින් සමාලෝචනය කර අනුමැතියන් ලබා දී නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.5 මාර්ගෝපදේශය ප්‍රකාරව රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ප්‍රසම්පාදන කමිටු පත් කළ යුතුව තිබුණත්, එකතුව රු.මිලියන 12.09 ක් වටිනා ප්‍රසම්පාදන කාර්යයන් දෙකකදී නියමිත පරිදි ප්‍රසම්පාදන කමිටු පත් කළ බව තහවුරු කිරීමට අදාළ සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 මාර්ගෝපදේශය ප්‍රකාරව දෙපාර්තමේන්තු තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයන්ගෙන් අවම වශයෙන් එක් සාමාජිකයෙක් විෂයය පිළිබඳව විශේෂඥයෙකු විය යුතු අතර, එක් සාමාජිකයෙකු රේඛීය අමාත්‍යාංශයේ හෝ ප්‍රසම්පාදන විෂයය සම්බන්ධයෙන් බාහිර පුද්ගලයෙකු විය යුතුය. එහෙත් අවස්ථා දෙකකදී එකතුව රු..මිලියන 19.11 ක් වූ ප්‍රසම්පාදන දෙකක් සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.1 (ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කාල සටහන, ප්‍රසම්පාදන ක්‍රමය සහ ලංසු කැඳවීමේ ලේඛන පිළිබඳව එකඟවීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ ඒකාබද්ධ රැස්වීමක් පැවැත්විය යුතු වුවද, රු.මිලියන 3.01 ක් වූ පොලිසැග් මළු මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 මාර්ගෝපදේශය ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවකට භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා රු.මිලියන 10 කට අඩු ප්‍රසම්පාදනයන් වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමය යටතේ සිදු කළ හැකිව තිබුණි. එම සීමාව ඉක්මවා අවස්ථා 04 කදී එකතුව රු.මිලියන 19.49 ක ප්‍රසම්පාදනයන් දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුව විසින් සිදු කර තිබුණි.

(ඊ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2. (අ) සහ (ආ) මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදනය ආරම්භ වීමේ සිට අවසන් වන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාල ක්‍රමානුකූලව විස්තර කරන ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කළ යුතුව තිබුණි. ලෝහ මුද්‍රා

600,000 ක් මිලදී ගැනීම සඳහා වූ ප්‍රසම්පාදනයේදී එවැනි කාලසටහනක් පිළියෙල කර නොතිබුණි.

(උ) තට්ටු ඇඳන් මිලදී ගැනීම සඳහා වූ රු.මිලියන 6.1 ක් වටිනා ප්‍රසම්පාදනය, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6:3:1 මාර්ගෝපදේශය ප්‍රකාරව සිදු කර නොතිබුණි.

(ඌ) අවස්ථා 02 කදී එකතුව රු.මිලියන 17.38 ක් වූ ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 8:9:1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව විධිමත් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

**2.4 වත්කම් කළමනාකරණය**

-----------------------------

ශ්‍රී ලංකා රේගුවේ වත්කම් කළමනාකරණය පිළිබඳව සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වත්කම් ලේඛනගත කිරීම**

-----------------------------

රේගු උපකාර්යාලයන් වෙත නිකුත් කරනු ලැබූ තට්ටු ඇඳන් 76 කින් එකතුව රු.මිලියන 2.40 ක් වටිනා තට්ටු ඇඳන් 35 ක වටිනාකම ලේඛනගත කර නොතිබුණි.

**(ආ) රජය සතු වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා නොකිරීම**

------------------------------------------------------------------

ශ්‍රී ලංකා රේගුව සතු පහත සඳහන් වත්කම් උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව භාවිතා කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(i) කොම්පඤ්ඤ වීදියේ මෝගන් පාරේ පිහිටි ශ්‍රී ලංකා රේගුවට අයත් නිවාස දෙකක් 2017 වර්ෂයේදී රු.604,319 ක් වියදම් කර ප්‍රතිසංස්කරණය කර තිබුණි. ඊට අමතරව එම නිවාස දෙක සඳහා රු.471,000 ක් වටිනා ඇඳන් 06 ක් හා මෙට්ට 12 ක් නිකුත් කර තිබුණද, එම නිවාස දෙකම භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ii) මෝගන් පාරේ පිහිටි ශ්‍රී ලංකා රේගුවට අයත් නිවාස 17 කින් යුතු නිවාස පේළි දෙකකින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිවාස 08 ක ප්‍රමාණය හැර ඉතිරි නිවාස සියල්ල අනාරක්ෂිතව පැවැතීමට ඉඩ හැර තිබුණි.

**(ඇ) වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

---------------------------------------------

මෝගන් පාරේ ශ්‍රී ලංකා රේගුවට අයත් භූමියක් තුළ පුද්ගලයින් දෙදෙනෙකු විසින් අනවසරයෙන් සිමෙන්ති ගල්වලින් නිවසක් සාදා විදුලිය හා ජල පහසුකම් ලබා ගෙන තිබුණි. එයින් අනවසර පුද්ගලයින් ඉවත්කර රාජ්‍ය දේපලවල නිරවුල් අයිතිය තහවුරු කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**(ඈ) වාහන උපයෝජනය**

----------------------

සමාලෝචිත වර්ෂය අවසන් වන විට ශ්‍රී ලංකා රේගුව සතුව වාහන 108 ක් පැවැති අතර, එම වාහනවලින් කිලෝ මීටර් 1,069,807 ක් ධාවනය කර තිබුණි. ඒ සඳහා ඉන්ධන හා ලිහිසි තෙල්, වාහන සේවා කිරීම හා වාහන අළුත්වැඩියා සඳහා රු.මිලියන 21.12 ක්ද සහ වාහන

රක්ෂණය කිරීම සඳහා රු.මිලියන 3.57 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 24.69 ක් වැය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් විවිධ වර්ගයේ වාහන ධාවනය වෙනුවෙන් රියදුරු වැටුප් හා දීමනා හැර කිලෝ මීටරයක් සඳහා රු.23.08 ක් වැය කර තිබුණි. ශ්‍රී ලංකා රේගුවේ පැවති සංචිත වාහනවලින් වාහන 104 ක් සඳහා මුදල් රෙගුලාසි 1646 ප්‍රකාරව දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා 2018 ජුනි 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.5 බැදීම් හා බැරකම්**

**සලසා තිබුණු ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම**

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට ප්‍රකාරව සලසා තිබුණු ප්‍රතිපාදනය ඉක්මවා බැදීම්වලට එළඹිය නොහැකි වුවත්, එම විධිවිධානවලට පටහැනිව වැය විෂයයන් 10 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු එකතුව රු.මිලියන 1,093 ක ඉතිරිය, රු.මිලියන 42 කින් ඉක්මවා රු.මිලියන 1,135 ක බැදීම්වලට එළඹ තිබුණි.

**2.6 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් සියළුම රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම අභිලි සලකුණු යන්ත්‍ර මගින් සිදු කළ යුතුව තිබුණි. නමුත්, ශ්‍රී ලංකා රේගුව විසින් එම චක්‍රලේඛ විධිවිධානය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉටු කර නොතිබුණි.

(ආ) රේගු ආඥා පනතේ 18(02) වගන්තිය අනුව ශ්‍රී ලංකා රේගුවට බදු මුදලක් අඩුවෙන් ගෙවා ඇත්නම් එම අඩුවෙන් ගෙවූ බදු මුදල නැවත අයකිරීමටද, වැඩිපුර අයකර ගෙන තිබුණු බදු ආපසු ගෙවීමටද නීතිමය ප්‍රතිපාදන සලසා තිබුණි. එහෙත් එම විධිවිධාන සැලැකිල්ලට ගෙන 2016 නොවැම්බර් 01 දින සිට 2017 ජුනි 15 දින දක්වා කාලය සඳහා එකතු කළ අගය මත බදු හා ආර්ථික සේවා ගාස්තු වශයෙන් එකතුව රු.මිලියන 320.06 ක් අඩුවෙන් අයකර ගෙන තිබුණි.
එසේ අඩුවෙන් අයකර ගෙන තිබුණු බදු හා ගාස්තු නැවත අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ශ්‍රී ලංකා රේගුව අපෙහොසත් වී තිබුණි.

(ඇ) නැවත ආනයනය කිරීමේ පදනම මත අපනයන සිදු කරන අවස්ථාවලදී ශ්‍රී ලංකා රේගුව විසින් නොමිලේ සහතික පත් නිකුත් කරනු ලබන අතර, එසේ නැවත ආනයනය කිරීමේ පරමාර්ථය මත අපනයනය කරනු ලබන භාණ්ඩ උපාංග හෝ අමතර කොටස් නියමිත පරිදි අදාළ කාලසීමාව තුළදී නැවත ආනයනය කර ඇති බව තහවුරු කිරීමට ක්‍රමවේදයක් ශ්‍රී ලංකා රේගුව විසින් හඳුන්වා දී නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එවැනි අවස්ථා 600 කදී අපනයනය කරන ලද භාණ්ඩවලින් අවස්ථා 167 කදී පමණක් ආනයනය කර තිබුණු බව නිරීක්ෂණය විය. මේ අනුව අවස්ථා 433 කදී අපනයනය කළ භාණ්ඩ නැවත ආනයනය කර නොතිබුණ ද, ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් සඳහා නිල නිවාස ලබාදීමේදී ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.4 වගන්තිය ප්‍රකාරව කලත්‍රයා රජයේ සේවකයෙකු දැයි තහවුරු කර වැටුපෙන් කුලී ගාස්තු අයකළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් අවස්ථා දෙකකදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඉ) නිවාස සංවර්ධන අධිකාරිය විසින් නිවාස පවරා ගැනීමේදී රේගු දෙපාර්තමේන්තුව වෙත රු.මිලියන 5.28 ක් වන්දි මුදල් ලබා දී තිබුණි. එම මුදල් රාජ්‍ය ආදායමට බැර නොකර නිල

නිවාස සම්බන්ධයෙන් කිසිදු සබඳතාවයක් නොමැති රේගු කළමනාකරණ හා වන්දි අරමුදලට බැර කර තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සිදුකරන ලද භාණ්ඩ වෙන්දේසිවලින් ශ්‍රී ලංකා රේගුව වෙත ලබාදිය යුතු හිමිකම් නොපෑ වෙන්දේසි මුදල් රේගු දෙපාර්තමේන්තු පොත් අනුව රු.මිලියන 31.89 ක් වී තිබුණි. නමුත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පොත් අනුව එම වටිනාකම රු.මිලියන 218.48 ක් වී තිබුණි. එම වටිනාකම් සසඳා ශ්‍රී ලංකා රේගුවට ලැබිය යුතු නිශ්චිත මුදල හඳුනාගැනීමට ශ්‍රී ලංකා රේගුව විසින් කටයුතු කර නොතිබුණු අතර ලැබිය යුතු මුදල අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ශ්‍රී ලංකා රේගුව විසින් කටයුතු කර නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා රේගුව විසින් 2014 හා 2015 වර්ෂවල විවිධ අවස්ථාවලදී අත්අඩංගුවට ගන්නා ලද බහාළුම් 20 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වරාය පරිශ්‍රයේ රඳවා ගෙන තිබුණි. මේ හේතුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට බහාළුම් මෙහෙයවීමේදී බහාළුම් දින 10,411 ක් රඳවා ගැනීමේ ඉඩකඩ අහිමි වී තිබුණි. එසේ දිගුකාලයක් බහාලුම් රඳවා තබා ගැනීම නිසා නැව් නියෝජිතයන්ගෙන් වරාය අධිකාරියට අයවිය යුතු ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

## 2.7 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරිම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| **වර්ෂය** | **වියදම් වර්ගය** | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 1,496.60 | 1,495.58 | 1.02 | 0.07 |
| | මූලධන | 776.79 | 775.88 | 0.91 | 0.12 |
| | **එකතුව** | **2,273.39** | **2,271.46** | **1.93** | **0.08** |
| 2014 | පුනරාවර්තන | 1,680.68 | 1,659.48 | 21.20 | 1.26 |
| | මූලධන | 398.11 | 354.13 | 43.98 | 11.05 |
| | **එකතුව** | **2,078.79** | **2,013.61** | **65.18** | **3.14** |
| 2015 | පුනරාවර්තන | 1,870.54 | 1,865.92 | 4.62 | 0.25 |
| | මූලධන | 214.60 | 181.00 | 33.60 | 15.66 |
| | **එකතුව** | **2,085.14** | **2,046.92** | **38.22** | **1.83** |
| 2016 | පුනරාවර්තන | 1,956.00 | 1,892.73 | 63.27 | 3.23 |
| | මූලධන | 100.00 | 87.05 | 12.95 | 12.95 |
| | **එකතුව** | **2,056.00** | **1,979.79** | **76.22** | **3.71** |
| 2017 | පුනරාවර්තන | 2,116.40 | 2,083.25 | 33.15 | 1.57 |
| | මූලධන | 565.95 | 218.75 | 347.20 | 61.35 |
| | **එකතුව** | **2,682.35** | **2,302.00** | **380.35** | **14.18** |

සමාලෝචිත වර්ෂය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් වූ ඉතිරිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රේගුවේ නිවාරණ අංශය යටතේ පවතින සමුද්‍ර අංශය නැවත ස්ථාපිත කිරීම වෙනුවෙන් මුර යාත්‍රා 06 ක් මිලදී ගැනීම සඳහා 2017 අයවැය යෝජනා මගින් රු.මිලියන

250 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එහෙත් එම කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉටු නොකිරීම නිසා සලසා තිබුණු මූලධන ප්‍රතිපාදනවල සියයට 61.22 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 3 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 261 ක ප්‍රතිපාදනය කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

(ඇ) වැය විෂයයන් 8 ක් සඳහා එකතුව රු.මිලියන 415 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 314 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 6 ක සිට සියයට 63 ක් දක්වා පරාසයක ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.8 ආදායම් ගිණුම්

### 2.8.1 ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම

ශ්‍රී ලංකා රේගුව විසින් 2017 වර්ෂය සඳහා ආදායම් සංකේත 17 ක් සඳහා එකතුව රු.මිලියන 757,800 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම ආදායම් සංකේත යටතේ එකතුව රු.මිලියන 728,271 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 96.10 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | **2017 දෙසැම්බර් 31 දිනට** | | | **ඉක්මවීම/ (ඌනතාවය)** | **රැස්කළ ආදායම ඇස්තමේන්තු** |
|---|---|---|---|---|---|
| | **ඇස්තමේන්තුගත ආදායම** | **තථ්‍ය ආදායම** | **ඉක්මවීම/ (ඌනතාවය)** | **ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස** | **කළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස** |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | | |
| 10.01.01.00 | 158,000 | 136,501 | (21,499) | (13.61) | 86.39 |
| 10.01.02.00 | 30 | 30 | 0 | 0 | 100.00 |
| 10.01.04.00 | 100,000 | 102,360 | 2,360 | 2.36 | 102.36 |
| 10.01.05.01 | 57,000 | 56,574 | (426) | (0.75) | 99.25 |
| 10.01.05.02 | 3,000 | 2,980 | (20) | (0.67) | 99.33 |
| 10.01.06.00 | - | - | - | - | - |
| 10.01.07.00 | - | - | - | - | - |
| 10.01.08.00 | 70,000 | 71,402 | 1,402 | 2.00 | 102.00 |
| 10.01.99.00 | - | - | - | - | - |
| 10.02.05.01 | 86,000 | 85,956 | (44) | (0.05) | 99.95 |
| 10.02.05.02 | 430 | 469 | 39 | 9.07 | 109.07 |
| 10.02.05.03 | 75,000 | 73,983 | (1,017) | (1.36) | 98.64 |
| 10.02.05.04 | 200,000 | 189,740 | (10,260) | (5.13) | 94.87 |
| 10.02.05.05 | - | - | - | - | - |
| 10.02.05.99 | 6,500 | 6,091 | (409) | (6.29) | 93.71 |
| 20.03.02.17 | 140 | 218 | 78 | 55.71 | 155.71 |
| 20.03.03.01 | 1,700 | 1,964 | 264 | 15.53 | 115.53 |

## 2.8.2 හිඟ ආදායම්

--------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම් අනුව එකතුව රු.මිලියන 19,483.85 ක ආදායම් හිඟහිටව පැවතුණි. එම හිඟ හිටි ආදායම 2001 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාල පරාසයකට අදාළ විය. 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේදී හිඟ ආදායම රු.මිලියන 1,831.96 කින් හෙවත් සියයට 8.59 කින් අඩුවී තිබුණි.

(ආ) විවිධ රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් ශ්‍රී ලංකා රේගුව වෙත පියවිය යුතු හිඟහිටි ආදායම් එම අමත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල වැය ශීර්ෂවලින් පියවා ගැනීම සාර්ථක ලෙස ඉටු කර ගෙන නොතිබුණි. ඒ නිසා පහත සඳහන් ආදායම් සංකේතවලට අදාළ හිඟහිටි ආදායම් වර්ෂ ගණනාවක කාල පරාසයක සිට හිඟහිටව පැවැත එමින් තිබුණි.

(i) ආනයන බදු ආදායම් සංකේතය යටතේ, ඉකුත් වර්ෂය අවසාන වන විට පැවැති රු.මිලියන 6,811.71 ක හිඟ ආනයන බදු ආදායමින් සමාලෝචිත වර්ෂයේදී කිසිදු හිඟ බදු මුදලක් අයකර ගෙන නොතිබුණි. එය ශ්‍රී ලංකා රේගුව යටතේ වන මුළු හිඟහිටි ආදායමෙන් සියයට 34.96 ක ප්‍රමාණයක් වී තිබුණි. එම හිඟහිටි ආදායමෙන් රු.මිලියන 5,105.22 ක් හෙවත් සියයට 74.95 ක් 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාල පරාසයක සිට හිඟහිටව පැවැත එමින් තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසන් වන විට වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු වශයෙන් රු.මිලියන 2,606.35 ක ආදායම් හිඟහිටව පැවැතුණි. එය ශ්‍රී ලංකා රේගුවේ සමස්ථ හිඟහිටි ආදායමෙන් සියයට 13.38 ක් නියෝජනය වී තිබුණි. හිඟහිටි ගුවන්තොටුපල සංවර්ධන බදු ආදායමෙන් රු.මිලියන 2,390.07 ක් හෙවත් සියයට 92 ක හිඟහිටි ආදායම් 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය අවසන් වන විට සමස්ථ හිඟහිටි බදු ආදායමින් සියයට 7.28 ක් හෙවත් රු.මිලියන 1,418.20 ක් හිඟ ආනයන සෙස් බදු ආදායම නියෝජනය කර තිබුණි. 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලපරාසයක් තුළ රු.මිලියන 1,336.11 ක ආදායම් හිඟහිටව පැවත එමින් තිබුණි.

(iv) 2011 වර්ෂයේදී අහෝසි කරන ලද ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු ආදායමින් 2011 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 42.43 ක් හිඟහිටව පැවතුණි. 2016 වර්ෂයේ පමණක් ඉන් රු.මිලියන 9.03 ක් අයකරගෙන තිබුණද, ඉතිරි හිඟ මුදල වූ රු.මිලියන 33.40 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. එම හිඟ මුදල 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාලපරාසයක සිට හිඟ හිටව පැවත එමින් තිබුණි.

(v) සමාලෝචිත වර්ෂය අවසන් වන විට විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු වශයෙන් රු.මිලියන 3,598.06 ක ආදායම් හිඟහිටව පැවැතුණි. එම හිඟහිටි ආදායමෙන් රු.මිලියන 15.13 ක ආදායම් 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණි.

(vi) 2016 දෙසැම්බර් 31 දින වන විටත් මත්පැන් නිෂ්පාදන බදු ආදායමෙන් රු.මිලියන 89.26 ක ආදායම් හිඟ හිටව පැවැතෙන බව වාර්තා කර තිබුණි. නමුත් සමාගමකින් අයවිය යුතුව තිබුණු රු.මිලියන 29.38 ක මත්පැන් නිෂ්පාදන බදු ප්‍රමාණයක් එම හිඟහිටි ආදායම් වාර්තාවට ඇතුළත් කර නොතිබුණි. එම හිඟහිටි ආදායම

සමාලෝචිත වර්ෂයේදී හිඟහිටි ආදායම් ලැයිස්තුවට ඇතුළත් කිරීම නිසා මුළු හිඟහිටි ආදායම රු.මිලියන 118.64 ක් දක්වා වැඩි වී තිබුණි.

(vii) පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ඛණිජ තෙල් නිෂ්පාදන බදු ආදායම ලෙස රු.මිලියන 1,859.19 ක් හෙවත් සියයට 32.57 කින් වැඩි වී තිබුණි. එය ශ්‍රී ලංකා රේගුවේ සමස්ථ හිඟහිටි බදු ආදායමෙන් සියයට 19.75 ක ප්‍රමාණයක් වී තිබුණි.

(viii) සමස්ථ හිඟ බදු ආදායමින් සියයට 5.37 ක් හෙවත් රු.මිලියන 1,047.63 ක් මෝටර් වාහන නිෂ්පාදන බදු ආදායම හිඟහිටව පැවැතුණි. එම හිඟහිටි ආදායමෙන් රු.මිලියන 240.83 ක් 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාල පරාසයක සිට පැවැත එමින් තිබුණි.

### 2.8.3 ආදායම් අහිමිවීම

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි සමාගම් විසින් දේශීය වෙළඳපොලට සපයනු ලබන ඇඟළුම් ඒකකයක් මත 2012 අංක 7 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ රු.25 ක් වූ බද්දක් අය කළ යුතුව තිබුණි. එම බදු ක්‍රියාවලිය 2016 නොවැම්බර් 01 දින සිට 2016 අංක 20 දරන එකතු කළ අගය මත (සංශෝධිත) බදු පනතින් ඒකකයට රු.75 ක් ලෙස සංශෝධනය කර තිබුණි. නමුත් ශ්‍රී ලංකා රේගුව විසින් දෙපාර්තමේන්තු නියෝග අංක 116 යටතේ එම විධිවිධාන 2017 ජුනි 14 දින දක්වා ප්‍රමාද කර ක්‍රියාත්මක කිරීම නිසා රු.මිලියන 166.59 ක ආදායම් රජයට අහිමි වී තිබුණි.

### 2.8.4 ආදායම් අත්හැරීම්

දඩ මුදල් හා රාජසන්තක කිරීම්වලට අදාළ ආදායම් සංකේතය යටතේ සමාලෝචිත වර්ෂය අවසන් වන විට එකතුව රු.මිලියන 570.10 ක හිඟ හිටි ආදායම්, ආදායම ගිණුම මගින් අනාවරණය කර නොතිබුණි.

### 2.8.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

2017 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ශ්‍රී ලංකා රේගුවේ ආදායම් එකතු කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුව විසින් ආදායම් සංකේත 17 ක් යටතේ රු.මිලියන 728,271 ක ආදායම් රැස් කර තිබුණි. ඉකුත් වර්ෂයේදී ආදායම් සංකේත 13 ක් යටතේ රු.මිලියන 699,872 ක ආදායම් රැසකර කර තිබුණු අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.මිලියන 28,399 ක් හෙවත් සියයට 4.06 කින් වැඩි වී තිබුණි. මත්පැන් නිෂ්පාදන බදු, අනෙකුත් නිෂ්පාදන බදු, ඛනිජතෙල් නිෂ්පාදන බදු, ඇඟලුම් සඳහා දේශිය විකුණුම් මත ගාස්තු හා විශේෂ වෙළඳ භාණ්ඩ බදු යන ආදායම් සංකේත යටතේ ආදායම් වැඩිවීම ඉකුත් වර්ෂයේ රැස්කළ ආදායමට වඩා වැඩියෙන් ආදායම් රැස්කිරීම කෙරෙහි බලපා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රේගුව විසින් පහත සඳහන් ආදායම් සංකේත 04 ක් මගින් එකතුව රු.මිලියන 275,000 ක ආදායම් රැස්කිරීම අපේක්ෂා කර වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේදී එම මුල් ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 381,500 ක් වශයෙන් සංශෝධනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ආදායම් සංකේතවලින් එකතුව රු.මිලියන 341,126 ක ආදායම් රැස්කර තිබුණි. ඒ අනුව, ශ්‍රී ලංකා රේගුව විසින් නිවැරදි ආදායම් තක්සේරු නොකිරීම නිසා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල රු.මිලියන 66,126 ක ආදායම් අඩුවෙන් දක්වා තිබුණි. මෙසේ ආදායම්

අඩුවෙන් සඳහන් කර වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසා ඇස්තමේන්තුගත අයවැය හිඟය එම ප්‍රමාණයෙන් වැඩි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | මුල් ඇස්තමේන්තුව අනුව ආදායම | සංශෝධනය කළ ආදායම් ඇස්තමේන්තුව | රැස්කළ ආදායම | ඇස්තමේන්තුගත අයවැය හිඟය අවම කළහැකිව තිබුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු | 65,000 | 70,000 | 71,402 | 6,402 |
| අනෙකුත් නිෂ්පාදන බදු | 5,000 | 6,500 | 6,091 | 1,091 |
| ඛනිජ තෙල් නිෂ්පාදන බදු | 55,000 | 75,000 | 73,893 | 18,893 |
| මෝටර් රථ නිෂ්පාදන බදු | 150,000 | 230,000 | 189,740 | 39,740 |
| එකතුව | 275,000 | 381,500 | 341,126 | 66,126 |

**2.9 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන්**

ශ්‍රී ලංකා රේගුව අදාළ විෂය අංක 24701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 50.00 | 49.84 | 42.00 | 43.04 | 310.00 | 198.34 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) හිඟ ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසන් වන විට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර

රු.මිලියන 5.23 ක් වී තිබුණි. එම හිඟහිටි ණය ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 4 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත් එම හිඟහිටි ශේෂය අයකර ගැනීමට ශ්‍රී ලංකා රේගුව අපොහොසත් වී තිබුණි.

**(ආ) නොසැසඳීම**

--------------

සමාලෝචිත වර්ෂය අවසන් වන විට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.201,449,097 ක් වී තිබුණි. පාලන ගිණුම අනුව එම ශේෂය රු.201,512,106 ක් වී තිබුණු අතර එදිනට රු.63,009 ක වෙනසක් අනාවරණය විය.

**2.10 අග්‍රිම ගිණුම**

-------------

2017 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව ශේෂයේ රු.මිලියන 1.11 වෙනසක් පැවැතුණි.

**2.11 පොදු තැන්පත් ගිණුම**

----------------------

ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා පවත්වා ගෙන යන තාවකාලික තැන්පතු ගිණුමේ ආරම්භක ශේෂය රු.මිලියන 10,829.62 ක් වී තිබුණි. එම කාලයට අදාළ උපලෙජරය ගිණුම් සමඟ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට විගණනයට ඉදිරිපත් කළ ගිණුමට අදාළ අවසාන ශේෂය භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අතර රු.මිලියන 46.94 ක වෙනසක් අනාවරණය විය.

**2.12 ටෙන්ඩර් තැන්පතු ගිණුම**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ටෙන්ඩර් තැන්පතු ගිණුමේ 2017 ජනවාරි 01 දින වන විට ශේෂය භාණ්ඩාගාර පොත් අනුව රු.මිලියන 135.92 ක් වී තිබුණි. දෙපාර්තමේන්තු පොත් අනුව එම ශේෂය සනාථ කර ගැනීම සඳහා කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) භාණ්ඩාගාර මුද්‍රිත අනුව ටෙන්ඩර් තැන්පතු ගිණුමේ වර්ෂය තුළ ලැබීම් එකතුව රු.මිලියන 73.41 ක්ද, මාසික ගිණුම් සාරාංශය අනුව රු.මිලියන 73.07 ක්ද, ඉදිරිපත් කළ ගිණුම අනුව රු.මිලියන 71.70 ක්ද හා තැන්පතු ලෙජරය අනුව රු.මිලියන 71.78 ක් වශයෙන් වාර්තා වී තිබුණි. මෙම වෙනස්කම් පිළිබඳ සැසඳීම් කර නොතිබුණි.

(ඇ) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව ටෙන්ඩර් තැන්පතු ගිණුමේ වර්ෂය තුළ ගෙවීම් එකතුව රු.මිලියන 129.08 ක්ද, ඉදිරිපත් කළ ගිණුම අනුව එය රු.මිලියන 127.48 ක්ද හා ලෙජරය අනුව රු.මිලියන 60.65 ක්ද වශයෙන් වාර්තා වී තිබුණි. මෙම වෙනස්කම් සසඳා නිවැරදිව වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ වර්ෂ 02 ක ඉක්මවූ එකතුව රු.මිලියන 37.31 ක ටෙන්ඩර් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව විධිමත් විමර්ශණයකින් පසුව රාජ්‍ය ආදායමට ගැනීමට පියවර ගෙන නොතිබුණි.

**2.13 ගුවන් මඟින් රැගෙන එනු ලබන භාණ්ඩ සඳහා අයකරනු ලබන තැන්පත් ගිණුම**

--------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගුවන් මගීන් ගෙන එනු ලබන භාණ්ඩ සඳහා අයකරනු ලබන විශේෂ තැන්පතු ගිණුමේ ආරම්භක ශේෂය හා අවසාන ශේෂය ලෙස පිළිවෙලින් රු.මිලියන 7.16 ක් හා රු.මිලියන 8.65 ක් සඳහා විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ගිණුමට අදාළව ලැබී තිබුණු එකතුව වූ රු.194,612 ක් ගිණුම් අංශයේ නඩත්තු කළ තැන්පතු ලෙජරයෙහි සටහන් කර නොතිබුණි. නමුත් ගුවන්තොටුපල තැන්පතු ලේඛනය අනුව එම මුදල් තැන්පත් කළ දිනම ආපසු ගෙවා තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 206 ප්‍රකාරව තැන්පතුවලින් මුදල් ආපසු ගැනීමේදී අදාළ රික්විෂන් පත්‍රයේ මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකු විසින් සහතික කළ යුතු වුවත්, අවස්ථා 12 කදී එකතුව රු.726,139 ක් නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂගේ අත්සනින් පමණක් නිදහස් කර තිබුණි.

(ඈ) අවස්ථා 24 කදී එකතුව රු.මිලියන 2.26 ක තැන්පතු නිදහස් කිරීමේදී මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකු විසින් සහතික කළ රික්විෂන් පත්‍රයක් නොමැතිව තැන්පත් ගිණුමෙන් නිදහස් කර තිබුණි. එම තැන්පත් නිදහස් කළ දිනය ද තැන්පත් ලේඛනයේ සඳහන් කර නොතිබුණි.

## 2.14 අත්අඩංගුවට ගන්නා ලද හා රාජසන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් අත්තිකාරම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2001 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අවස්ථා 1,533 කදී ලබාදී තිබූ රු.මිලියන 24.97 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවා නොතිබුණි. එම ශේෂ සනාථ කිරීම සඳහා ලේඛන ද විගණනය වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබුණි.

(ආ) විමර්ශන අවස්ථා 17 ක් සඳහා ලබාදී තිබූ එකතුව රු.771,356 ක අත්තිකාරම් එම විමර්ශන කටයුතු අවසන් වී ත්‍යාග මුදල් ගෙවා තිබුණත්, ලබා දී තිබුණු අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවා නොතිබුණි.

(ඇ) විමර්ශන අවස්ථා 7 කදී ලබාදී තිබූ රු.726,585 ක අත්තිකාරම් 2017 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.261,345 ක් පමණක් පියවා තිබුණි.

## 2.15 අග්‍රිම ශේෂය පියවීමේ ප්‍රමාදය

ශ්‍රී ලංකා රේගුව විසින් 2017 දෙසැම්බර් 29 දින 24 පැයට මුදල් පොත් තුලනය කර වසා දැමූ බව සඳහන් කර තිබුණද, එදිනට පැවති රු.මිලියන 1.11 ක මුදල් ශේෂය 2018 ජනවාරි 16 දින භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර තිබුණි.

## 2.16 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව උපලබ්ධි නොවූ තැන්පතු වශයෙන් එකතුව රු.මිලියන 7.48 ක් දක්වා තිබුණි. එම තැන්පතුවලින් රු.මිලියන 4.17 ක තැන්පතු වර්ෂ 06 ක කාලයක සිට පැවත එමින් තිබුණත්, එම තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 189 හා 486 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව එකතුව රු.166,662 ක් හඳුනා නොගත් ගෙවීම් ලෙස දක්වා තිබුණු අතර එම ගෙවීම් තුළ 2015 වර්ෂයට අදාළ එකතුව රු.151,824 ක ශේෂයන් 02 ක් ද ඇතුළත්ව පැවතුණි. එම ගෙවීම් හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.17 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛනයක් පවත්වා නොතිබුණු අතර තවත් ලේඛනයක් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි. |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීනව කර පවත්වා නොතිබුණි. |

## 2.18 විගණන සාක්ෂි නොවීම

මුදල් රෙගුලාසි 272(2) ප්‍රකාරව කටයුතු නිම නොකළ රු.861,986 ක් වටිනා ගෙවීම් වවුචර් 08 ක් අස්ථානගත වී තිබුණි.

## 2.19 අනුකූල නොවීම්

### 2.19.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| (i) XIX පරිච්ඡේදයේ 6.1 වගන්තිය | - | නිල නිවාසයේ පදිංචි කාලය වර්ෂ 05 කට සීමා කර නොතිබුණි. |
| (ii) XIX පරිච්ඡේදයේ 6.1(ආ) වගන්තිය | 586,500 | නිලධාරීන් දෙදෙනෙකු විසින් විධිවිධානවලට පටහැනිව මාසික ගෙවල් කුලී රජයෙන් ලබා ගෙන තිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (iv) මුදල් රෙගුලාසි 565 (1) 4 | 10,829,621,083 | තැන්පත් ලෙජරවල ආරම්භක ශේෂ සටහන් කර නොතිබුණි. |
| (vi) මුදල් රෙගුලාසි 565 (5) | | එක් එක් වර්ෂය සඳහා පොදු 71 ආකෘති පත්‍රයේ පිළියෙල කරන මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් ඊළඟ මාසයේ |

| | | |
|---|---|---|
| | | අවසන් වීමට ප්‍රථම විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, එසේ සිදු කර නොතිබුණි. |
| | **(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**<br>---------------------------- | |
| | 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන චක්‍රලේඛය | සියළුම රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩල පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා කළ යුතු වුවත් ශ්‍රී ලංකා රේගුව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| | **(ඇ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ**<br>------------------------ | |
| **2.19.2**<br>**බදු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම**<br>-------------------------------------<br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | 2010 ජුලි 12 දිනැති අංක 209/20102,003,201 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 4.2 හා 4.3(2) ඡේද ප්‍රකාරව | චක්‍රලේඛය ප්‍රකාරව, 2017 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් අනුව තැන්පතු ශේෂය හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව තැන්පතු ශේෂය අතර රු.මිලියන 2.00 ක වෙනස හඳුනාගෙන තිබුණද, එම වෙනස සසඳා නිවැරදි කිරීමට 2018 මැයි 31 දින වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| | **(ඉ) වෙනත් චක්‍රලේඛ**<br>------------------- | |
| | දෙපාර්තමේන්තු චක්‍රලේඛ (DOPL) අංක 696 | (i) තාවකාලිකව මෙරටට ගෙන එන ලද භාණ්ඩ සඳහා වන තීරුබදු හා අනෙකුත් බදු ප්‍රමාණ භාණ්ඩයේ බිල්පත්/ තක්සේරු වටිනාකම අනුව රේගු අධීක්ෂණ නිලධාරියා විසින් තීරණය කර එම බදු ප්‍රමාණයට සමාන වටිනාකමක් තැන්පතු ලෙස රඳවා ගත යුතු වුවත්, එම විධිවිධානයන්ට පටහැනිව ඇතැම් අවස්ථාවල අදාළ බදු වටිනාකමට අමතරව සියයට 10 ක අතිරේක මුදලක් ද තැන්පතු ලෙස රඳවාගෙන තිබුණි.<br>(ii) මෙරටට පැමිණෙන මගීන් විසින් සිදු කරන මුදල් තැන්පතු සහ ඒවා නැවත ගෙවීම සම්බන්ධයෙන් වෙනම ලෙජරයක් යාවත්කාලීන කිරීම කළ යුතු බව සඳහන් කර තිබුණත්, ඒ සම්බන්ධයෙන් වෙනම ලෙජරයක් යාවත්කාලීන කර නොතිබුණි |
| | ( අ ) | |

2017 අංක 7 දරන ආර්ථික සේවා ගාස්තු සංශෝධන පනත අනුව 2017 අප්‍රේල් 01 දින සිට ආනයනික වාහනවලින් සියයට 0.5 ක ආර්ථික සේවා ගාස්තුවක් අයකළ යුතුව තිබුණි. යථෝක්ත ආර්ථික සේවා ගාස්තු අය කරන ලෙස රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා රේගුව වෙත 2017 ජුනි 15 දින දන්වා තිබුණි. ඒ අනුව දින 76 ක කාල ප්‍රමාදයකින් පසුව 2017 අප්‍රේල් 01 දින සිට 2017 ජුනි 15 දින දක්වා කාලපරිච්ඡේදය තුළ ආනයනය කර තිබූ වාහන 17,142 කින් රු.මිලියන 153.48 ක බදු ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) රේගු සංයෝජිත වර්ගීකරණ අංක 8703.22.69 යටතේ ආනයනය කළ යුතු අවුරුදු 03 ට වඩා පැරණි Mazda RX8 පෙට්‍රල් මෝටර් රථ (1300 CC) 33 ක් රේගු සංයෝජිත වර්ගීකරණ අංක 8703.90.99 යටතේ ආනයනය කිරීම හේතුවෙන් රු.මිලියන 114.6 ක රේගු බදු අහිමි වී තිබුණි.

## 2.20 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

-------------------------------------------------------------------------------------------

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 1,348 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු. 307,642 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 329 | 296 | 33 |
| (ii) | තෘතියික මට්ටම | 1152 | 777 | 375 |
| (iii) | ද්විතියික මට්ටම | 987 | 696 | 291 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 505 | 422 | 83 |
| (v) | අනියම්/කොන්ත්‍රාත් | 2973 | 2191 | 782 |
| | එකතුව | 5946 | 4382 | 1564 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආනයනික භාණ්ඩ මගින් රජයේ ආදායම සැලකිය යුතු දායකත්වයක් සිදු කරනු ලැබුවද, ශ්‍රී ලංකා රේගුව විසින් ආනයනික භාණ්ඩ ඇතුළත් බහාළුම් පරීක්ෂා කිරීමේ කටයුතු විධිමත්ව හා ප්‍රමාණවත්ව සිදු කිරීම සඳහා ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් යොදාගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රේගුවේ එක් එක් අංශ වෙත අනුයුක්ත කර ඇති නිලධාරීන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ලේඛනයක් මානව සම්පත් කළමනාකරණ අංශය විසින් හෝ පාලන අංශය විසින් යාවත්කාලීන කර නොතිබුණි. ඒ අනුව, ඒ ඒ අංශවල අවශ්‍යතාවයන්ට අනුකූල වන අයුරින් නිලධාරීන් අනුයුක්ත කර තිබුණු බව තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි